# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2117/49 - 2019 අප්‍රේල් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2019.04.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

32 සහ 33 වගන්ති යටතේ නියෝග

විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය හරීන් ප්‍රනාන්දු වන මා 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 (ආ) සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව නෙට්බෝල් ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා නෙට්බෝල් සම්මේලනයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර තාවකාලික වැඩපිළිවෙලක් වශයෙන් එකී ශ්‍රී ලංකා නෙට්බෝල් සම්මේලනයේ කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් අතුරු පාලක කමිටුව පත් කරමි.

| | | | |
|---|---|---|---|
| 1. | මිටිමානගේ යමුනා පෙරේරා මහත්මිය | - | සභාපති |
| 2. | රංජිත් විමලසූරිය මහතා | - | ලේකම් |
| 3. | එදිරිසිංහ දේවගේ ආශා ලක්මාලි එදිරිසිංහ මහත්මිය | - | භාණ්ඩාගාරික |

තවද, ශ්‍රී ලංකා නෙට්බෝල් සංගමයේ නිළවරණය පැවැත්වීම සඳහා 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ සංශෝධිත රෙගුලාසි අනුව එම සංගමයෙහි විශේෂ මහා සභා රැස්වීමක් කැඳවා එමගින් නිළවරණ කමිටුවක් පත් කිරීම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මගින් සිදු කිරීමටත් නිළවරණ කමිටුව මගින් නිළවරණය කැඳවීම හා පැවැත්වීම අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ සිදු කිරීමටත් බලය පවරමි.

හරීන් ප්‍රනාන්දු, (පා.ම.)
විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය.

2019 අප්‍රේල් මස 03 වැනි දින.

04 - 636


1A - G 29827 — 22 (2019/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*